සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும் கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business Development and Underutilized State Resources Development


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/05/MF/ | | 2020.09.02 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2020/11**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්/ බැංකු සමිති කළමණාකරුවන්.**
**ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු / පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත,**

**<u>සමෘද්ධි බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අරමුදල සපයා ගැනීමට ණය උපදෙස්</u>**

01. අරමුණු :-

සමෘද්ධි බැංකු/ බැංකු සමිති බොහෝමයකට ගොඩනැගිලි ඉදිකිරීම, අත්‍යාවශ්‍ය වුවත් ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති බව පෙනී යයි. එබැවින් බැංකු/ බැංකු සමිති සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමට ණය මුදලක් ලබාදීම සහ ලබාගැනීම සම්බන්ධ අවශ්‍ය මඟ පෙන්වීම මෙමඟින් සිදුවේ. එම ණය මුදල "ගොඩනැගිලි ඉදිකිරීම් ණය මුදල" ලෙස හැඳින්වේ.

02. අරමුදල සපයන ආයතන

2.1 ප්‍රජාමූල බැංකු සමිතිය - සමෘද්ධි බැංකු සමිතිය සතු අරමුදල්.
2.2 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ක්ෂුද්‍ර මූල්‍ය අංශය - ක්ෂුද්‍ර මූල්‍ය අංශය සතු අරමුදල්

03. අරමුදල් ලබාදෙන ආකාරය.

3.1 ගොඩනැගිල්ලක් ඉදිකිරීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇතත් ඒ සඳහා මූල්‍ය ශක්තියක් නොමැති බැංකු සඳහා තම බැංකු සමිතියේ ප්‍රමාණවත් අරමුදල් ඇත්නම් ණය මුදලක් ලබාගත හැක. එම ණය මුදල "සමෘද්ධි බැංකු සමිතියෙන් ලබාගත් ගොඩනැගිලි ඉදිකිරීම් ණය මුදල" ලෙස හැඳින්වේ.

3.2 ඉහත ඡේදයෙහි 3.1 හි සඳහන් පරිදි බැංකු සමිතියට ණය මුදලක් ලබාදීමට මූල්‍ය ශක්තියක් නොමැතිවිට, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ණය මුදලක් ලබාගත හැක. එම ණය මුදල "සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබාගත් ගොඩනැගිලි ඉදිකිරීමේ ණය මුදල" ලෙස හැඳින්වේ.




**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

3.3 සමෘද්ධි බැංකු සමිතියක් සඳහා ගොඩනැගිල්ලක් ඉදි කර ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇතත් ඒ සඳහා මුල්‍ය ශක්තියක් නොමැති බැංකු සමිති සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍රමුල්‍ය අංශයෙන්, ණය මුදලක් ලබාගත හැක. එම ණය මුදල ද "සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මුල්‍ය අංශයෙන් ලබාගත් ගොඩනැගිලි ඉදිකිරීම් ණය මුදල" ලෙස හැඳින්වේ.

## 04. ලබාදෙන ණය මුදල

4.1 ලබාදෙන උපරිම ණය මුදල රු. 5,000,000/- කි.

4.2 අලුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී ගොඩනැගිල්ලේ වර්ග ඵලය අඩි 1200 – 1500 අතර ඇති විටක ණය මුදලක් ලබාගත හැක.

4.3 ගොඩනැගිල්ල ඉදිකිරීමට ඇස්තමේන්තුගත වටිනාකම ආසන්න, දහස් ගණනට ගණනය කර ණය මුදල ලබාගත හැක.
උදා:-
රු. 2,000,000/-, 2,500,000/-, 3,000,000/-, 3,500,000/-, 4,000,000/-, 4,500,000/-

## 05. පොලි අනුපාතය

5.1 වාර්ෂික පොලි අනුපාතය 8% කි.

5.2 පොලිය අයකරනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමය අනුවය. ණය මුදල සහ කාලය අනුව මාසික ණය වාරිකය සකස් කර ගැනීමට ඇමුණුම් 03 වගුව භාවිතා කළ යුතුය.

5.3 ණය මුදල අනුමත කර, මුදාහරින අවස්ථාවේදීම මාසිකව ගෙවිය යුතු මාසික වාරිකය හා පොලිය (Installment and Interest) මාසික වාරිකය ගෙවිය යුතු නියමිත දිනය සඳහන් කරමින් ක්ෂුද්‍ර මුල්‍ය අංශයෙන් හෝ ණය මුදල ලබාදුන් බැංකු සමිතිය විසින් දන්වනු ඇත. මෙය ණය මුදාහැරීමේ නිවේදනය මඟින් දැනුම්දෙනු ඇත. (ඇමුණුම - 04 )

5.4 ලබාගත් ණය මුදල හි වාරිකය/ වාරිකයන් එනම් ණය මුදලේ මාසික වාරිකය හා පොලිය බැංකු සමිතියට හෝ දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මුල්‍ය අංශයට නියමිත දිනට ප්‍රථම ලබාදිය යුතුය. එහිදි වාරිකය හෝ පොලිය කිසිදු අඩුවකින් තොරව ගෙවිය යුතුය.

5.5 ණය වාරික හා පොලි ගෙවිය යුතු නියමිත දිනට හෝ දින 15 ක් ඇතුලත දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මුල්‍ය අංශයට හෝ ණය ලබාගත් බැංකු සමිතියට ගෙවීමට අපොහොසත් වුවහොත් මාසික ණය වාරිකයට (Installment) 5% ක් දඩ මුදලක් ලෙස අය කෙරේ. එලෙසම චෙක්පතක් අණකරු විසින් ගෙවීම් නතර කළ විටකදී ගාස්තු වශයෙන් අය කරනු ලබන මුදල ණය ලබාගත් අය විසින් ක්ෂුද්‍ර මුල්‍ය අංශයට හෝ බැංකු සමිතියට ගෙවිය යුතුව ඇත. .

## 06. ණය ආපසු ගෙවීමේ කාලය

6.1 ණය මුදල ආපසු ගෙවිය යුතු කාලය උපරිම මාස 60 කි.

6.2 ණය ආපසු ගෙවිය යුතු කාලය ණය මුදාහල නිවේදනයේ සඳහන් කරනු ඇත.

6.3 බැංකු සමිතියෙන් ලබාගත් ණය මුදල, බැංකු සමිතියට ගෙවිය යුතුය.

6.4 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මුල්‍ය අංශයෙන් ලබාගත් ණය මුදලෙහි මාසික වාරිකය සමෘද්ධි බැංකු/ බැංකු සමිතිය සෘජුව ක්ෂුද්‍ර මුල්‍ය අංශයට එවිය යුතුය.

## 07 ණය මුදල ඉල්ලුම් කිරීම සහ ණය මුදල මුදාහැරීම.

7.1 ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ක්ෂුද්‍ර මුල්‍ය අංශයෙන් අනුමැතිය ලබාදුන් පසුව, සකස් කල ගොඩනැගිලි ඇස්තමේන්තු ගත මුදල වැය කිරීමට සමෘද්ධි බැංකු/ බැංකු සමිතිය සතුව අරමුදල් නොමැති විටක සමෘද්ධි බැංකුවක් නම් පළමුවෙන් බැංකු සමිතිය හරහා ණය මුදලක් ඉල්ලුම් කළ යුතුය. බැංකු සමිතිය සතුව ප්‍රමාණවත් අරමුදලක් නොමැති බව දැනුම් දුන් විටක, ඊළඟ පියවර ක්ෂුද්‍ර මුල්‍ය අංශය වෙතින් ණය මුදලක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. නමුත් බැංකු සමිතිය නම්, කෙලින්ම ක්ෂුද්‍ර මුල්‍ය අංශය වෙතින් ණය මුදලක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.

7.2 ණය මුදලක් ලබාගැනීම සහ අවශ්‍ය කරන මුදල සම්බන්ධ වාර්තාවක් සකස් කර පළමුව පාලක මණ්ඩල/ විධායක කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

7.3 පාලක මණ්ඩල/ විධායක කමිටුව අනුමැතිය ලබාගත් පසු සමෘද්ධි බැංකුව විසින් ණය ඉල්ලීම බැංකු සමිතිය වෙත ඉදිරිපත් කළ යුතුය. බැංකු සමිතියක් නම් ක්ෂුද්‍ර මුල්‍ය අංශයට ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා ඇමුණුම් 01 ණය ඉල්ලුම් පත්‍රය භාවිතා කළ යුතුය. මෙහිදි සම්පූර්ණ ඇස්තමේන්තු මුදල එකම ස්ථානයකින් ලබාගැනීම සිදු කළ යුතුය.

7.4 සමෘද්ධි බැංකුවක් ණය මුදලක් ඉල්ලුම් කර ඇති විටක, බැංකු සමිති කළමනාකරු විසින් විධායක කමිටු රැස්වීමට පහත ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

I. ණය ඉල්ලුම් පත්රය
II. බැංකුව සතු අරමුදල් තත්ත්වය
III. පසුගිය ආසන්න වර්ෂ 03 ලාභ/ අලාභ තත්ත්වයන්
IV. බැංකු සමිතිය සතු අතිරික්ත අරමුදල් ප්‍රමාණයන් රු.
V. ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින්, ගොඩනැගිල්ල අනුමත කරන ලද ලිපිය.

7.5 ඉහත ඡේද අංක 7.04 තොරතුරු පදනම් කරගෙන, විධායක කමිටුව විසින් ණය මුදල අනුමත කිරීම හෝ අනුමත නොකිරීම් සිදු කරයි. ඉන් අනතුරුව එම තීරණය සමෘද්ධි බැංකු වෙත ලිඛිතව දැනුම්දීම සිදු කළ යුතුය.

7.6 බැංකු සමිතිය ණය මුදල අනුමත කර ඇති විටක, ඇමුණුම- 02 ගිවිසුම පිටපත් 02 සකස් කර අදාල පාර්ශව විසින් අත්සන් කර, ප්‍රාදේශිය ලේකම්ගේ සහතිකය ලබාගත යුතුය.

7.7 බැංකු සමිතිය විසින් සමෘද්ධි බැංකුවට ණය මුදල මුදා හැරීම

7.7.1 බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා සමෘද්ධි
බැංකු වෙත ලබාදුන් ණය ගිණුම් - හර (කේත අංකය 7409)
ජංගම ගිණුම - බැර

ණය මුදල මුදාහැරීම සමඟ, ඇමුණුම් - 05 හි සඳහා ණය පාලන ලෙජරයේ තොරතුරු හා අගයන් දැක්වීමට කළ යුතුය.

7.7.2 චෙක්පත සමඟ ඇමුණුම් - 04 සංශෝධන සහිත සකස් කරගත් ආකෘතිය සම්පූර්ණ කර, ණය මුදා හැරීමේ නිවේදනය සම්පූර්ණ කර සමෘද්ධි බැංකුව වෙත ලබාදීම සිදු කළ යුතුය. ඉන් අනතුරුව චෙක්පත ලද බවට තහවුරුවක් ලබාගත යුතුය.

7.8 සමෘද්ධි බැංකුවට ණය මුදලට අදාල චෙක්පත ලද පසු, චෙක්පත බැංකු ගත කර, උපලබ්ධිවීමෙන් අනතුරුව පහත පැවරුම් තැබිය යුතුය.
ගණුදෙනුකරුවන් තැන්පත් කල චෙක්පත් ගිණුම - හර
බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ලබාගත් අරමුදල්ණය ගිණුම් - බැර

මෙම නව ගිණුම පොදු ලෙජරයේ කේත අංකය 3320 යටතේ විවෘත කර සටහන් කළ යුතුය. එසැනින් ඇමුණුම් - 06 හි සඳහන් බැංකු සමිතියෙන් ලබාගත් ගොඩනැගිලි ඉදිකිරිම් ලෙජරයේ සටහන් කළ යුතුය.

7.9 සමෘද්ධි බැංකු සමිතිය විසින් ණය මුදලක් ලබාදීමට නොහැකි බවට ලිඛිතව දැන්වූ අවස්ථාවක, සමෘද්ධි බැංකුව ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙතින් ණය මුදලක් ඉල්ලුම් කිරීමට කටයුතු කළ යුතුය.

7.10 සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය විසින් ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ණය මුදලක් ඉල්ලුම් කිරීම.

7.10.01 ඇමුණුම් - 01 සඳහන් ණය ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර, පාලක මණ්ඩල/ විධායක කමිටුව ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

7.10.02 ඉන් අනතුරුව, ණය ඉල්ලුම් පත්‍රය ක්ෂුද්‍ර මූල්‍ය අංශයට පහත ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතුය.

I. ගිවිසුම් පත්‍රය (ඇමුණුම් 02)
II. ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් ගොඩනැගිල්ල ඉදිකිරිමට අනුමැතිය ලබාදුන් ලිපියේ පිටපතක්.

7.11 ක්ෂුද්‍ර මූල්‍ය අංශය ණය මුදල අනුමත කර සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය වෙත ලබාදීම.

7.11.1 ණය මුදල අනුමත වී, චෙක්පත සමෘද්ධි බැංකුව ලද පසු බැංකුගත කිරීම සහ උපලබ්ධියෙන් පසු ගිණුම්ගත කිරීම.

| | |
|---|---|
| ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම | - හර |
| බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් අරමුදල් ණය ගිණුම් | - බැර (කේත අංක 3320) |

එසැනින්, ඇමුණුම් 06 හි සඳහන් "බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් අරමුදල් ණය ලෙජරය" සටහන් කළ යුතුය.

7.11.2 ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින්, ණය මුදලට අදාල චෙක්පත බැංකු සමිතියට ලද පසු, බැංකුගත කර උපලබ්ධියෙන් අනතුරුව පහත සටහන් තැබිය යුතුය.

| | |
|---|---|
| ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම | - හර |
| බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබාගත් අරමුදල් ණය ගිණුම් | - බැර (කේත අංක 9313) |

7.11.3 එසැනින් ඇමුණුම් 06 "බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම් සඳහා ලබාගත අරමුදල් ණය ලෙජරය" පිළියෙල කර සටහන් කළ යුතුය.

## 08 ණය වාරිකය සහ පොලිය ගෙවීම සහ ගිණුම්ගත කිරීම.

8.1 සමෘද්ධි බැංකුව, බැංකු සමිතියෙන් ලබාගත් ණය මුදලෙහි වාරිකය ගෙවීම

| | |
|---|---|
| බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් අරමුදල් ණය ගිණුම | - හර (කේත අංකය 3320) |
| ගෙවූ පොලිය - බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලබාගත් අරමුදල් ණය ගිණුම | - හර (කේත අංකය 2143) |
| ජංගම ගිණුම | - බැර |

එසැනින්, ඇමුණුම් 06 හි සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගත අරමුදල් ණය ලෙජරයේ සටහන් කර ඇමුණුම් 07 නිවේදනය සමඟ චෙක්පත අතින් හෝ ලියාපදිංචි තැපැලෙන් බැංකු සමිතිය වෙත යොමු කිරීම කළ යුතුය.

8.2 මාසික ණය වාරිකය, බැංකු සමිතියට ලැබීමෙන් පසුව, බැංකුගත කර උපලබ්ධියෙන් අනතුරුව පහත පරිදි පොදු ලෙජරයේ සටහන් කළ යුතුය.

| | |
|---|---|
| ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම | - හර |
| බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමෘද්ධි බැංකු වෙත ලබාදුන් ණය ගිණුම | - බැර (ණය මුදලහි වාරිකය) |
| ලද ආදායම් විශේෂ ව්‍යාපෘති ඉපැයීම් ගිණුම | - බැර (පොලි මුදල)(කේත අංක 5103) |

ඉන් අනතුරුව, ඇමුණුම් 05 හි සඳහන් ණය පාලන ලෙජරයේ සටහන් කළ යුතුය. සමෘද්ධි බැංකු කිහිපයකට ණය මුදල් ලබාදී ඇති විටක ඒ ඒ බැංකුව නමින් වෙන වෙනම ලෙජර් නඩත්තු කළ යුතුය.

8.3 ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙතින් ලබාගත් ණය මුදලෙහි මාසික ණය වාරිකය සහ පොලිය ලබාදීම.

8.3.1 "සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබාගත් ගොඩනැගිලි ණය ගෙවීම්" යනුවෙන් ලියා, ණය මුදාහැරීමේ නිවේදනය සඳහන් ජංගම ගිණුමට බැර වනසේ චෙක්පත පිළියෙල කර, ඇමුණුම් 08 සඳහන් නිවේදනය සමඟ ලියාපදිංචි තැපැලෙන් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවිය යුතුය. ඒ සඳහා පහත ගිණුම් සටහන් තැබිය යුතුය.

**සමෘද්ධි බැංකුව**

බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ලබාගත් අරමුදල් ණය ගිණුම - හර (ණය වාරිකය)
ගෙවූ පොලිය - බැංකු ගොඩනැගිලි ඉදිකිරිම සඳහා ලබාගත් අරමුදල් ණය ගිණුම - හර (ණය පොලිය)
ජංගම ගිණුම - බැර

එසැනින් ඇමුණුම් - 06 හි සඳහන් ණය පාලන ලෙජරයේ මාසික ණය වාරික සහ පොලිය ගෙවූ බවට සටහන් කළ යුතුය.

**සමෘද්ධි බැංකු සමිතිය**

බැංකු ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන්
ලබාගත් අරමුදල් ණය ගිණුම් - හර
ගෙවූ පොලිය- බැංකු සමිති ගොඩනැගිලි ඉදිකිරිම සඳහා
ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් ලබාගත් අරමුදල් ණය ගිණුම - හර (කේත අංකය 6105)
ජංගම ගිණුම් - බැර

ඉන් අනතුරුව ඇමුණුම් 06 සඳහා ණය පාලන ලෙජරයේ ණය වාරික ගෙවීම සටහන් කිරීම සිදු කළ යුතුය.

8.4 ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන්/ බැංකු සමිතිය මඟින් ලබාගත් ණය මුදලක මාසික ණය වාරිකය ණය මුදල නිකුත් කළ දිනයේ සිට දින 30 ක්ඇතුලත ගෙවීම් කළ යුතුය. ඒ සම්බන්ධව තොරතුරු ණය මුදල් නිකුත් කල නිවේදනය ඇමුණුම 04 ඇතුලත් කර ඇත. තවද, 5% දඩ පොලිය ගෙවූ පොලිය- ගොඩනැගිලි ඉදිකිරිම සඳහා ලබාගත් අරමුදල් ණය ගිණුමෙහි සටහන් කළ යුතුය.

09. ණය ලබාදෙන කාර්යයන්

මෙම ණය වැඩසටහන යටතේ ණය මුදල් ලබාදෙන කාරණාවන් පහත වේ.

9.1 නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
9.2 නව ගොඩනැගිල්ලක බිම් මහල ඉදිකිරිම.
9.3 දැනටමත් බිම් මහල ඉදි කල ගොඩනැගිල්ල හි පළමු මහල ඉදිකිරිම.
9.4 පවතින ගොඩනැගිල්ල නවීකරණය කිරීම.
9.5 ඉදිකරමින් පවතින ගොඩනැගිල්ල හි වැඩ අවසන් කිරිම.
9.6 ආරක්ෂිත වැට ඇතුළු වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

10. ණය ලබාගැනීම අවශ්‍ය සුදුසුකම් හා උපමානයන්.

10.1 මූල්‍ය සහ අනෙකුත් තත්ත්වයන්

10.1.1 අදාල බැංකුව/ බැංකු සමිතිය ක්‍රියාකාරි ලෙස ස්ථාපනය වී තිබිය යුතුය.
10.1.2 සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය ආරම්භ කර වසර දහයක වඩා කාලයක් ගත වී තිබිය යුතුය.
10.1.3 බැංකුව/ බැංකු සමිතිවල පොදු ලෙජරයේ ශේෂ පරීක්ෂණය සහ කේවල ශේෂ පිරික්සුම් තුලනය වී තිබිය යුතුය.
10.1.4 අලාභ තත්ත්වයක් පෙන්නුම් කල ද, වාර්ෂික පාඩුවේ ප්‍රතිශතය අඩුවීමේ ප්‍රවණතාවක් පසුගිය වර්ෂ 03 කාලයක් තුල පෙන්නුම් කර තිබීම.
10.1.5 බැංකුව/ සමිතිය පාඩු ලැබුවත් මනා මූල්‍ය කළමනාකාරිත්වයක් පවතින බවට දිස්ත්‍රික් විගණන අංශය විසින් තහවුරු කළ යුතුය.

11. සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරිමට අනුමැතිය ලබාගැනීමේදී පමණක් මෙම කරුණු සම්පූර්ණ කළ යුතු බව සලකන්න.

නව ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා වු අවශ්‍යතාව සඳහන් කරමින් යෝජනාවක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. (Proposal)

- කළමනාකරු විසින් සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරිමේ අවශ්‍යතාවය සාධාරණියකරණය කිරීම.
- බැංකු පාලක මණ්ඩලයේ/ විධායක කමිටුවේ අනුමැතිය තිබිය යුතුය.
- දිස්ත්‍රික් ඉංජිනේරු පවතින ගොඩනැගිල්ල බැංකු කටයුතු සඳහා අනාරක්ෂිත බවට තහවුරු කරන ලද ලිපිය.
- ගොඩනැගිල්ල ඉදිකරනු ලබන භූමිය පවරාදීමේ ලේඛනය/ අයිතිය තහවුරු කරන ලේඛනය ඉදිරිපත් කිරීම.
- සමෘද්ධි බැංකුවක් ඉදිකිරිමේදී නම්, බැංකු සමිති කළමනාකරු ද, බැංකු සමිතියක් නම් මුලස්ථාන කළමනාකරුගේ සහතිකය.
- ප්‍රාදේශිය ලේකම් නිර්දේශ කිරීම.
- දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ එකඟතාවය සහිතව ඉදිරිපත් කිරිම.

12. සමෘද්ධි බැංකුව හෝ බැංකු සමිතිය විසින් ඉදිරිපත් කළ යෝජනාව දෙපාර්තමේන්තුව විසින් පිළිගත් පසු ඉන් අනතුරුව ඉදිකරන ගොඩනැගිල්ල සඳහා අනුමැතිය ලබාදීමට පහත සඳහන් ලිපි ලේඛන එවිය යුතුය.

I. ගංවතුර ගැලීමේ හෝ නායයෑමේ අවදානමක් පවතින ප්‍රදේශයක ගොඩනැගිල්ල ඉදි කරන භූමිය එම භූවිද්‍යා පතල කාර්යාංශය මඟින් ගොඩනැගිල්ලක් ඉදිකිරිමට සුදුසු බවට නිර්දේශ ලබාගැනීම.
II. විරීරේඛා සහ නොපරවා ගැනීමේ සහතික පළාත් පාලන ආයතන වෙතින් ලබාගැනීම.
III. ත්‍රාස්තවාදී හා උවදුරු පැවැති ප්‍රදේශයක නම්, බෝම්බ නිෂ්ක්‍රිය කරන ලද ස්ථානයක් බව, තහවුරු කර ගැනීම.
IV. නව ගොඩනැගිල්ල ඉදි කරනු ලබන භූමියෙහි සැලැස්ම පළාත් පාලන ආයතනයෙන් අනුමත කර තිබිය යුතුය.
V. නව ගොඩනැගිල්ල ඉදි කරනු ලබන්නේ පැරණි ගොඩනැගිල්ල පවතින ස්ථානයේ නම්, පැරණි ගොඩනැගිල්ල ඉවත් කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරියකුගේ නිර්දේශය සමඟ දිස්ත්‍රික් ඉංජිනේරු නිර්දේශය ලබාගත යුතුය.
VI. ගොඩනැගිලි ඉදිකිරිම් ඇස්තමේන්තුව, දිස්ත්‍රික් ඉංජිනේරු නිර්දේශ කර, දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ අනුමත කර තිබිය යුතුය.
VII. ගොඩනැගිලි ඉදිකිරිම සඳහා අනෙකුත් ආයතන වලින් ලබාගත යුතු අනුමැතින් මීට අමතරව ලබාගැනීමට අවශ්‍ය නම් ඒවා ඉදිරිපත් කළ යුතුය.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

<u>පිටපත්</u>

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.